# වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

# රත්නපුර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 28 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 13 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජූලි 29 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිළි කිරීම් අනුව, වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර 2012 දෙසැම්බර් 31 දිනට වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙයෙහුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතයෙ වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් සහ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා තිබූ රු. 176,390 ක වටිනාකමින් යුත් ස්ථාවර වත්කම් අදාල වත්කම් ගිණුමට හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) උතුරු හුණුවල සහ පැලැන්කන්ද ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් රු. 9,404,460 ක්වූ ණය මුදල ණය ගිණුම මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ගිණුම් විෂයයන් තුනකට අදාලව 2012 දෙසැම්බර් 31 දිනට පාලන ගිණුම් අනුව ශේෂ එකතුව රු. 1,112,892 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව ශේෂ එකතුව රු. 1,067,993 ක් වූයෙන් වෙනස රු. 44,899 ක් විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්න වියදම ඉක්ම වූ ආදායම රු. 686,904 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,368,151 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය හා ආදායම් හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 300 | 408 | 108 |
| (ii.) | බදු කුලී | 762 | 828 | 66 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 430 | 661 | 231 |
| (iv.) | වෙනත් ආදායම් | 6,546 | 2,305 | 4,241 |

#### 2.2.2 බදු කුලී

2009 වර්ෂයේ සිට හිඟව පවතින රු. 11,350 ක් වූ පොළ බදුකුලී අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i.) | උසාවි දඩ | 1,267,658 |
| (ii.) | මුද්දර ගාස්තු | 111,126 |

2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

(අ) වැලිගෙපොල ප්‍රාදේශීය සභා උප කාර්යාලය හා ස්වර්ණ ජයන්ති පුස්තකාලය ඉතාමත් පැරණි සහ අළුත්වැඩියා කල යුතු තත්ත්වයේ පවතින අබලන් ගොඩනැගිලි දෙකක පවත්වා ගෙන යන අතර, මෙම ගොඩනැගිලි අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල අවස්ථා දෙකකදී රු. 407,505 ක් වැය කර වීදි පහන් කට්ටල 90 ක් මිලදී ගෙන 14 ක් සවිකිරීම් කර තිබුණි. ඉතිරි කට්ටල 76 ක් 2012 දෙසැම්බර් 11 දින භෞතික පරීක්ෂාව සඳහා ඉදිරිපත් නොවීය.

2.4 අවිධිමත් ගනුදෙනු

-----------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005 ජූනි 08 දිනැති අංක 1386/18 දරණ අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව වෛද්‍ය හේතූන් මත හැර නිවාඩු සඳහා සභාවේ අනුමැතිය ලබා ඇති අවස්ථා වලදී සභික දීමනා සඳහා හිමිකම් නොලබන නමුත් සමාලෝචිත වර්ෂයේදී සභිකයින් තිදෙනෙකු සඳහා රු. 25,000 ක සභික දීමනා ගෙවා තිබුණි.

2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

-----------------------------------------------------------

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තියේ විධිවාධන වලට පටහැනිව විෂයය භාර ඇමතිතුමාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන 2012 මැයි 02 දින රු. 15,120 ක් සුභ පැතුම් බැනර් 04 ක් සඳහා වියදම් කර තිබුණි.

2.6 අරමුදල් උපයෝජනය

----------------------------

සමාලෝචිත වර්ෂයේ දී වැය විෂයයන් 31 කට අදාලව රු. 2,132,000 ක්වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදන මුළුමනින්ම උපයෝජනය කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය